# ද මැසිනොද් විදුහල, කඳාන
# De Mazenod College, Kandana

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

2024-06

පළමු වාර පරීක්ෂණය-2024 | 10 ශ්‍රේණිය | කාලය මිනි. 30

- සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

චමරි තම ජීවනෝපාය ලෙස රොටි, ඉඳි ආප්ප, පිට්ටු සකසා ඇයගේම නිවස ඉදිරිපිට තබා අලෙවි කිරිමේ ව්‍යාපරයක් පවත්වාගෙන යයි.

1) චමරි විසින් සපුරාලනු ලබන මූලික අවශ්‍යතාව කුමක්ද ?
   1. ආහාර
   2. නිවාස
   3. ඇඳුම්
   4. සෞඛ්‍යය

2) මෙහි රොටි, ඉඳි ආප්ප, පිට්ටු යනාදිය හඳුන්වන්නේ,
   1. යෙදවුම් ලෙසය
   2. නිෂ්පාදිත ලෙසය
   3. අවශ්‍යතා ලෙසය
   4. ප්‍රාග්ධනය ලෙසය

3) ඉහත සිද්ධිය සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
   A. මෙම ව්‍යාපාරය විවිධ මිනිස් වුවමනා නිර්මාණය කරයි.
   B. මෙම ව්‍යාපාරය සේවා සැපයීමේ ව්‍යාපාරයකි
   C. මෙම ව්‍යාපාරය පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානයකි
   D. මෙම ව්‍යාපාරය අසල පිහිටි එවැනිම ඇඳුම් මසා අලෙවි කිරිමේ ව්‍යාපාර මෙම ව්‍යාපාරයට ද්වර්ලතාවයකි.

   ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශ වනුයේ,
   1. A හා B
   2. B හා C
   3. A හා C
   4. C හා D

4) ව්‍යාපාරයක් යනුවෙන් අදහස් කරනුයේ
   1. ලාභ ලැබීමේ අරමුණින් සිදුකරනු ලබන ඕනෑම ආර්ථික කටයුත්තකි.
   2. පුද්ගලයින් දෙදෙනෙකු විසින් පවත්වාගෙන යනු ලබන ගිවිසුමකි
   3. මිනිස් අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය විවිධ වූ භාණ්ඩ හා සේවා නිෂ්පාදන කිරීම හෝ සැපයීම ආශ්‍රිත ආර්ථික කටයුත්තකි.
   4. භාණ්ඩ නිෂ්පාදනය හා බෙදා හැරීම ආශ්‍රිත ආර්ථික කටයුත්තකි

5) ලාභ අපේක්ෂිත ව්‍යාපාරවල පොදුවේ දැකිය හැකි ව්‍යාපාර අරමුණක් හෝ උප අරමුණක් නොවන්නේ,
   1. ලාභ ඉපයීම
   2. සේවක සුභ සාධනය
   3. පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම
   4. සමාජ සුභ සාධනය

6) පහත දැක්වෙන පිළිතුරු අතරින් අවශ්‍යතාවල ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
   1. අත්‍යවශ්‍ය වීම, පොදුවීම, නිර්මාණය කළ නොහැකි වීම
   2. අසීමිත වීම, අත්‍යවශ්‍ය වීම, පොදුවීම
   3. නිර්මාණය කළ හැකිවීම, අත්‍යවශ්‍ය වීම, විවිධ වීම
   4. සංකීර්ණ වීම, පොදුවීම, නිර්මාණය කළ නොහැකි වීම

7) නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතවල ස්වභාවය අනුව ව්‍යාපාර වර් ග කළ හැකි ආකාරය වනුයේ,
1. පෞද්ගලික අංශයේ ව්‍යාපාර හා පොදු අංශයේ ව්‍යාපාර
2. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර හා සේව සැපයීමේ ව්‍යාපාර
3. ලාභ අරමුණු කරගත් ව්‍යාපාර හා ලාභ අරමුණු කරනොගත් ව්‍යාපාරය
4. මහා පරිමාණ ව්‍යාපාර හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර

8) ව්‍යාපාරයක් සඳහා අයිතිකරුවකු යොදන මුදල් අයත්වන නිෂ්පාදන සාධකය වනුයේ,
1. භූමිය
2. ශ්‍රමය
3. ප්‍රාග්ධනය
4. ව්‍යවසාය

9) පහත දැක්වෙන ව්‍යාපාර අතරින් සේවා සැපයීමේ ව්‍යාපාරයක් නොවන්නේ කුමක්ද ?
1. රූපලාවන්‍ය ආයතනය
2. බැංකු ආයතනය
3. සිල්ලර වෙළඳ ආයතන
4. ඇඟලුම් කර්මාන්ත ශාලාවන්

10) ව්‍යාපාරයක නිෂ්පාදන සාධකයක් වන ව්‍යාවසායකත්වය සඳහා නිදසුනක් දැක්වෙන පිළිතුර වන්නේ,
1. නිෂ්පාදනයේදී භාවිතා කරන අමුද්‍රව්‍ය
2. ව්‍යාපාරයට යොදවා ඇති මුදල්
3. ව්‍යාපාරයේ අයිතිකරු
4. ව්‍යාපාරයේ සේවකයන්

11) ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශවයන් ලෙස අයිතිකරුවන්ගේ අරමුණක් නොවන්නේ,
1. තම නිෂ්පාදනවල මිල තීරණය කිරීම
2. ප්‍රමාණවත් ලාභයක් ලබා ගැනීම
3. ව්‍යාපාරයේ අනාගත වර්ධනය
4. ආයෝජනවල සුරක්ෂිතතාවය

12) ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශයවක් වන රජය වෙතින් ව්‍යාපාරය සඳහා බලාපොරොත්තු වන දායකත්වය වන්නේ,
1. ව්‍යාපාර කටයුතු සුපරික්ෂණය
2. ප්‍රමාණවත් ප්‍රාග්ධන දායකත්වයක් ලබා දීම
3. ලැබිය යුතු බදු ආදායම් නිසි ලෙස ලබා ගැනීම
4. ව්‍යාපාරය සඳහා විවිධ දිරි ගැන්වීම් ලබා දීම

13) සේවක කුසලතා සංවර්ධනය සඳහා ව්‍යාපාරය විසින් පැවැත්වූ වැඩසටහන එහි සියලු සේවකයින් සාර්ථකව නිම කිරීම එම ව්‍යාපාරයට,
1. ශක්තියකි
2. අවස්ථාවකි
3. දුර්වලතාවයකි
4. තර්ජනයකි

14) ව්‍යාපාරික යෙකුට පහසුවෙන් පාලනය කල හැකි පරිසරයකි,
1. නෛතික පරිසරය
2. දේශපාලන පරිසරය
3. අභ්‍යන්තර පරිසරය
4. ගෝලීය පරිසරය

15) රටක මිල උද්ධමන අනුපාතිකය අයත්වන පරිසර සාධකය කුමක්ද ?
1. දේශපාලන පරිසරය
2. නෛතික පරිසරය
3. තාක්ෂණික පරිසරය
4. ආර්ථික පරිසරය

16) පහත සඳහන් ද අතරින් ව්‍යාපාරයක් සඳහා බලපාන තර්ජනයක් නොවන්නේ,
1. තරගකරුවන් බිහිවීම
2. ජාත්‍යන්තර වෙළඳ සම්බන්ධතා පැනවීම
3. ව්‍යාපාරයේ භූගෝලීය පිහිටීම නුසුදුසුවීම
4. ස්වභාවික ආපදා

17) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය අධ්‍යයනය කිරීම තුලින් හඳුනාගත හැකි වන්නේ,

1. ශක්තීන්, අවස්ථා
2. ශක්තීන්, දුර්වලතා
3. දුර්වලතා, තර්ජන
4. තර්ජන, අවස්ථා

18) රසායනික පොහොර හා අනෙකුත් කෘෂි රසායන ද්‍රව්‍ය ආනයනය නතර කිරීමට රජය තීරණය කරයි. රජයේ මෙම තීරණය,

1. කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන ව්‍යාපාරවලට ශක්තියකි
2. තාක්ෂණ පරිසරයට අයත් සාධකයකි
3. දේශපාලන පරිසරයට අයත් සාධකයකට නිදසුනකි
4. රසායනික පොහොර අලෙවිකරුවන්ට අවස්ථාවකි

19) ව්‍යාපාර සංවිධාන කිහිපයක් පහත දැක්වේ.

A. හවුල් ව්‍යාපාර
B. සමීත සමාගම්
C. ඒක පුද්ගල ව්‍යාපාර
D. සමුපාකාර
E. රාජ්‍ය සමාගම්
F. දෙපාර්තමේන්තු
G. රාජ්‍යය සංස්ථාව

මේවා අතරින් පොදු අංශයට අයත් ව්‍යාපාර සංවිධාන පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. A,D,E
2. B,D,F
3. C,F,G
4. E,F,G

20) පහත ව්‍යාපාර සංවිධාන අතරින් පෞද්ගලික අංශයට අයත් ලාභ අරමුණු නොමැති ව්‍යාපාර සංවිධානය වනුයේ,

1. ඒක පුද්ගල ව්‍යාපාර
2. සංස්ථාපිත සමාගම්
3. හවුල් ව්‍යාපාර
4. සමුපාකාර සමිති

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## පළමු වාර පරීක්ෂණය - 2024

## 10 - ශ්‍රේණිය

2024.06

Learning Resource Centre
R
De Mazenod
Kandana

උපදෙස්

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

**1.** පහත සඳහන් සිද්ධිය ඇසුරින් අංක (i) සිට අංක (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඇඳුම් මැසීමේ පාඨමාලාවක් සාර්ථකව නිමකල සයුරි 2024 ජනවාරි 01 දින තම නිවසේ කොටසක ළමා ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් ආරම්භ කළාය. තමා ඉතිරි කර ගත් රු 80 000 ක මුදල හා මහජන බැංකුවෙන් රු 100 000 ක මුදලක් අඩු පොලියකට ලබාගෙන මහන යන්ත්‍රයක් හා රෙදි පිළි මිලට ගත්තාය. මේ සඳහා පළපුරුදු සේවිකාවක් ද රු 30 000 ක මාසික වැටුපක් යටතේ බඳවාගත් අතර තම නිවස නගරයේ ජනප්‍රිය පාසැලක් අසල පිහිටා තිබීම නිසා පළමු මාසය අවසන් වන විට ඉල්ලුම වැඩි වී ව්‍යාපාරය ඉතා සාර්ථකත්වයට පත්විය.

i. සයුරිගේ ව්‍යාපාරය විසින් සපුරාලන මිනිස් අවශ්‍යතාවය හා වුවමනාව ලියන්න.

ii. සයුරිගේ ව්‍යාපාරය සාර්ථක වීමට බලපෑ ශක්තීන් දෙකක් ලියන්න.

iii. මෙම ව්‍යාපාරයේ දක්නට ලැබෙන අභ්‍යන්තර පරිසර සාධක දෙකක් ලියන්න.

iv. මහජන බැංකුවෙන් අඩු පොලියට ණය ලබාගැනීම අයත්වන බාහිර පරිසර සාධකය කුමක්ද?

v. සයුරිගේ ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශ්ව දෙකක් නම් කරන්න.

vi. සයුරිගේ ව්‍යාපාරයට බාහිර පරිසරයෙන් එල්ල විය හැකි තර්ජන දෙකක් ලියන්න.

vii. සයුරිගේ ව්‍යාපාරය නිෂ්පාදිතයේ ස්වභාවය අනුව වර්ග කර දක්වන්න.

viii. මෙම ව්‍යාපාරය විසින් බැංකු ණය ලබාගැනීමේදී ඉටුකළ යුතු අවශ්‍යතා දෙකක් ලියන්න.

ix. සයුරිගේ ව්‍යාපාරය විසින් යොදාගෙන ඇති නිෂ්පාදන සාධක දෙකක් නිදසුන් සහිතව නම් කරන්න.

x. මෙම ව්‍යාපාරය තවදුරටත් සාර්ථක කර ගැනීම සඳහා සයුරිට ලබාදිය හැකි උපදෙස් දෙකක් ලියන්න.

2. i. (අ) ව්‍යාපාරයක් යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

(ආ) ව්‍යාපාරයකින් පාරිභෝගිකයා අපේක්ෂා කරන අරමුණු දෙකක් ලියන්න.

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) අත්‍යවශ්‍ය වීම වුවමනාවක ලක්ෂණයකි.

(ආ) ව්‍යාපාරයේ අනාගත වර්ධනය කළමනාකාරුවන්ගේ අරමුණකි.

(ඉ) සිල්ලර වෙළෙඳසැල භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි.

(ඊ) රැකියා අවස්ථා උත්පාදනය රජය විසින් බලාපොරොත්තු වන අරමුණකි.

iii. (අ) පොදුවේ ව්‍යාපාරවල දැකිය හැකි අරමුණු දෙකක් ලියන්න.

(ආ) පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා අතර දැකිය හැකි වෙනස්කම් දෙකක් ලියන්න.

iv. ඔබ ප්‍රදේශයේ පවත්නා භාණ්ඩ නිෂ්පාදනය කරන ව්‍යාපාර හා සේවා සපයන ව්‍යාපාර දෙක බැගින් නම් කරන්න.

v. ඇඟලුම් කම්හල්වලින් ඉවතලන රෙදි කැබලි මිලට ගන්නා 'දිනෙලි' ඇය විසින් සොයාගනු ලැබූ සුවිශේෂී ක්‍රමයකට "විසිතුරු උපකරණ" නිර්මාණය කර විද්‍යුත් මාධ්‍යය ඔස්සේ අලෙවි කිරීම සිදු කරයි.

(අ) ඉහත සිද්ධියේ සඳහන් නිෂ්පාදන සාධක දෙකක් නිදසුන් සහිතව දක්වන්න.

(ආ) විද්‍යුත් මාධ්‍යය ඔස්සේ ව්‍යාපාරික කටයුතු සිදුකිරීම තුළින් දිනෙලිට ලබාගත හැකි වාසියක් දක්වන්න.

3. i. (අ) ව්‍යාපාර ඇල්මැති පාර්ශවයන් යන්න අර්ථ දක්වන්න.

(ආ) පහත සඳහන් ඇල්මැති පාර්ශ්වයන් ව්‍යාපාරයෙන් ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණ බැගින් ලියන්න.

- ගනුදෙනුකරුවන්
- රජය

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) භාණ්ඩ හා සේවාවල මිල ගණන් අඛණ්ඩව ඉහළ යාම දේශපාලන පරිසරයට අයත් සාධකයකි.

(ආ) ව්‍යාපාරයක සේවකයෝ අභ්‍යන්තර පරිසර සාධකයක් වන අතර ගනුදෙනුකරුවෝ බාහිර පරිසර සාධකයකි.

(ඉ) දැඩි තරගකාරීත්වයකට මුහුණු දීමට සිදු වීම, දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන හිතකර බලපෑමකි.

(ඊ) ව්‍යාපාරයක් නව නිෂ්පාදන ක්‍රම භාවිතයට ගැනීම එම ව්‍යාපාරයට තර්ජනයකි.

iii. (අ) පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සඳහා රජය පනවා ඇති නීතිරීති ක්‍රියාත්මක කිරීමට පිහිටුවා ඇති ආයතනයක් නම් කරන්න.

(ආ) තාක්ෂණික පරිසරයෙන් නව යන්ත්‍ර සූත්‍ර සොයා ගැනීම නිසා ව්‍යාපාරවලට ඇති වූ හිතකර බලපෑමක් ලියන්න.

iv. ග්‍රාමීය ප්‍රදේශයක ජීවත්වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ මනා දැනුමක් ඇති අමර, පුබුදමු ලංකා ව්‍යාපෘතිය යටතේ දුරකථන හා අන්තර්ජාල පහසුකම් තම ප්‍රදේශයට ලැබීමෙන් පසු ප්‍රදේශයේ ඉහළ ඉල්ලුමක් පවතින සන්නිවේදන සේවා සැපයීම සඳහා ආයතනයක් ***City Communication*** නමින් ආරම්භ කළේ ය.

(අ) දුරකථන හා අන්තර් ජාල පහසුකම් ලැබීම කුමන පරිසර බලවේගයකට අයත් ද?

(ආ) අමරගේ ව්‍යාපාරයට ශක්තියක් හා අවස්ථාවක් සිද්ධිය ඇසුරින් ලියන්න.

v. (අ) තාක්ෂණික වෙනස්කම් නිසා ව්‍යාපාරවල සිදු වූ වෙනස්කම්වලට නිදසුනක් දක්වන්න

(ආ) දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන අහිතකර බලපෑම් දෙකක් ලියන්න.

4. i. (අ) ව්‍යාපාර සංවිධාන වර්ග කළ හැකි ආකාර දෙකක් ලියන්න.

(ආ) පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේදී යොදාගනු ලබන ප්‍රමාණාත්මක නිර්ණායක දෙකක් ලියන්න.

ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) තේවල ස්වාමී ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීමේ දී එම ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ලැබේ.

(ආ) වෘත්තීය සේවා සපයන ව්‍යාපාර සම්බන්ධයෙන් හවුල් ව්‍යාපාර ක්‍රමය ජනප්‍රියව පවතී.

(ඉ) සීමාසහිත සමාගමක් ප්‍රාග්ධනය සපයාගන්නා මාර්ගය වන්නේ කොටස් නිකුත් කිරීම යි.

(ඊ) සමූපකාර සමිති නීතිමය පුද්ගලභාවයක් ඇති ව්‍යාපාර සංවිධාන විශේෂයකි.

iii. (අ) අනෙකුත් ව්‍යාපාරවලට සාපේක්ෂව සීමිත සමාගම්වල දැකිය හැකි වාසි දෙකක් ලියන්න.

(ආ) තනි පුද්ගල ව්‍යාපාරයක දැකිය හැකි ලක්ෂණ දෙකක් නම් කරන්න.

iv. ව්‍යාපාර සංවිධාන කිහිපයක් පහත දක්වේ.

A - මහර සිංහ සමාජය

B - බණ්ඩාර සහ සහෝදරයෝ

C - ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

D - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

(ආ) ඉහත දක්වූ ව්‍යාපාර හිමිකාරීත්වය අනුව වර්ග කර දක්වන්න.

(ආ) ඉහත ව්‍යාපාර අරමුණු අනුව වර්ග කර දක්වන්න.

v. තනි පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමෙන් ලබාගත හැකි ප්‍රතිලාභ දෙකක් ලියන්න.